## නැගෙනහිර පළාත් සභාව - 2021 වර්ෂය

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 ජනාරි 10 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තා 2022 ඔක්තෝම්බර් 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2 ) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂණ පද්ධති සවිගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) විසින් මිලදී ගත් පිළිවෙලින් රු. මිලියන 159.80 ක් සහ රු. මිලියන 38.9 වූ විවිධ මූල්‍ය නොවන වත්කම් අදාළ දෙපාර්තමේන්තු ගිණුම්වල සහ සමාලෝචිත වර්ෂයේ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. මේ හේතුවෙන් ජංගම නොවන වත්කම් සහ සමුච්චිත අරමුදල් ශේෂ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | එම ප්‍රාග්ධන වියදම් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලට එකතු කිරීමට අදාළ දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | මූල්‍ය නොවන වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වෙත ගෙන යා යුතු අතර එම වටිනාකම ද විගණනයට තහවුරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (ii) වගන්තිය ප්‍රකාරව විවිධ සේවා සමුපකාර සමිති (MPCS) 45 කින් ලැබිය යුතු රු. මිලියන 60.31ක සමුපකාර අරමුදල් ආදායම ගිණුම්ගත කිරීමට හෝ අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට උපදෙස් දී ඇත. | සමුපකාර අරමුදලේ හිඟ මුදල් අදාල කාල රාමුව තුළ අයකර ගත යුතු අතර ඉතිරිය වසර අවසානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගෙන යා යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදි මිලදී ගත් එකතුව රු. මිලියන 55.87 ක්වූ ආයුර්වේද ඖෂධ ද්‍රව්‍ය තොගයෙන් එකතුව රු. මිලියන 45.96ක් විවිධ ආයුර්වේද මධ්‍යස්ථාන වෙත සපයා තිබූ අතර, රු. මිලියන 9.91ක් වූ ඉතිරි ඖෂධවල වටිනාකම ආයුර්වේද මධ්‍යස්ථාන ගිණුම්වල හෝ පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව විසින් නිකුත් කරනු ලබන ඖෂධ සඳහා වන වවුචර්පත් "අදාළ ආයතනයේ පවත්වාගෙන යනු ලබන ඖෂධ ලේඛනවලට ඇතුළත් කර" පරීක්ෂා කිරීමෙන් පසු ගෙවීම් සඳහා සහතික කර ඇත. එසේ වුවද රුපියල් 9,912,578 ක මුදලකට මිලදී ගෙන තිබූ ඖෂධ අතපසුවීමකින් නිකුත් කළ ලැයිස්තුවට එකතු කර නොමැත. ඉදිරියේදී මෙවැනි වැරදි අවම කිරීමට කටයුතු කරනු ලැබේ. | මිලදී ගත් අගයන් නිවැරදි ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය වෙත ගෙන ආ යුතුය. |
| (ඈ) | ප්‍රධාන අමාත්‍යාංශයට අයත් එකතුව රු. මිලියන 29.1ක්වූ වාහන 02 ක් 2019 වර්ෂයේදී ප්‍රධාන ලේකම් කාර්යාලයට සහ අම්පාර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට තාවකාලිකව මුදා හැර තිබූ නමුත් මෙම වාහනවල වටිනාකම ප්‍රධාන අමාත්‍යාංශයේ සහ පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | එය ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වලට ගනු ලැබේ. | එවැනි වත්කම්වල අයිතිය තහවුරු කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනා ගත යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි පිළියෙල කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නැගෙනහිර පළාත් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය - 901 පළාත් රාජ්‍ය සේවා කොමිසම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සහ 2021 වර්ෂවල පැවත්විය යුතු විවිධ තනතුරුවල ට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග 12ක් සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත් ලැබී තිබුණද, මෙම වාර්ථාවේ දිනය දක්වාම එම කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | මෙම විභාග 2020.01.31 දින කැඳවනු ලැබුවද, 2020 සහ 2021 වසර පුරාවටම Covid-19 පැතිරීම සහ දිවයින පුරා ඇඳිරි නීතිය වරින් වර ක්‍රියාත්මක වීම හේතුවෙන් 2020 හෝ 2021 දී මෙම විභාග පැවැත්වීමට නොහැකි විය. | කාර්යක්ෂමතා කඩඉම් විභාග තවදුරටත් ප්‍රමාදයකින් තොරව පැවැත්වීමට කඩිනම් පියවර ගත යුතුය. |

**1.5.2 ශීර්ෂය - 902 පළාත් සභා ලේකම් කාර්යාලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාව විසුරුවා හැර දැනට වසර 04 ක් ගතවී තිබුණද සභා ලේකම් කාර්යාලයේ සේවයේ නිරත වීම සඳහා අනුමත කර තිබූ සේවක සංඛ්‍යාවෙන් සියයට 87ක් වූ ද්විතීයික මට්ටමේ කාර්ය මණ්ඩල සේවකයන් 16 දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩල සේවකයන් 10 දෙනෙකු කිසිදු කාර්යය පැවරීමකින් තොරව සේවයේ යොදවා තිබූ අතර 2019 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රු.මිලියන 40.74 ක් පුද්ගලික පඩිනඩි ලෙස ගෙවා තිබුණි. මෙම පළාත් සභාවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහ අමාත්‍යාංශවල පැවති පුරප්පාඩු පිරවීමට එම කාර්ය මණ්ඩලය යොදවා නොමැති බවත් නියැදි විගණන පරීක්ෂාවෙන් අනාවරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) හට ස්ථිර සේවකයින් වෙනත් දෙපාර්තමේන්තු වෙත මාරු කිරීමේ බලය ඇත. | මෙම නිලධාරීන් නැගෙනහිර පළාතේ අවශ්‍ය අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු වෙත මාරු කිරීමට කටයුතු කළ යුතුයි. |

**1.5.3 ශීර්ෂය - 912 ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 10කට අධික කාලයක සිට පැවැත එන රු. මිලියන 4 ක අත්යන්ත්‍ර රෙදිපිළි ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම ණයගැතියන් සම්බන්ද කේවළ ශේෂ විස්තර සහ කාල විශ්ලේෂණ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ණයගැති විස්තර නොමැත. | හිඟ ණයගැති ශේෂයන් අයකර ගැනීමටත් අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමතුලිත ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන **(BRDP)** යටතේ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් එරාවූර්**,** වීරමුනේ සහ සීතනාවේලිහි ඇඟළුම් කම්හල් **03**ක් රු. මිලියන 191.04 ක පිරිවැයකින් ඉදිකර 2017 වර්ෂයේදී රු.440,000 ක මාසික කුලී පදනමට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ගිවිසුමක් **(PPPA)** යටතේ පුද්ගලික සමාගමකට ලබා දී තිබුණි. කෙසේ වෙතත්**,** වීරමුණේ සහ සීතනාවේලි හි පිහිටි කර්මාන්තශාලා වර්ෂ 04 කට අධික කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා භාවිත | නව ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට මූලික කටයුතු සිදු කර ඇතත් රට තුළ ඇති වූ අනපේක්ෂිත තත්ත්වය හේතුවෙන් පුහුණු කටයුතු සඳහා පුහුණුකරුවන්ට උපකරණ ලබාදීමේ ක්‍රියාවලිය අත්හිටුවා ඇත. මේ වසරේ සිට ඇඟලුම් කම්හල ආරම්භ කරන බව පෞද්ගලික සමාගම මා හට දන්වා ඇත. ඒ අනුව, "සීතනවේලි" ඇඟලුම් කම්හල 2022 පෙබරවාරි මස වැඩ | ඇඟලුම් කම්හල් ප්‍රයෝජනයට ගැනීමටත් හිඟ කුලී අයකර ගැනීමටත් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණු අතර 2017 සැප්තැම්බර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය වෙනුවෙන් අයවිය යුතු රු. මිලියන 20.67 ක හිඟ කුලී අයකර ගැනීමටද අපොහොසත් වී තිබුණි. | ආරම්භ කරන ලද අතර එය කම්කරුවන් 36 දෙනෙකුගෙන් සමන්විත වේ. | |
| (ඇ) | රු.මිලියන 4.60ක් වටිනා අපජල පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් ප්‍රයෝජනයට නොගෙන වසර 03ක් පුරා ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම ජල පවිත්‍රාගාරය සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් සිටී. | අපජල පවිත්‍රාගාරය අපේක්ෂිත කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**1.5.4 ශීර්ෂය - 920 ප්‍රධාන ලේකම් කාර්යාලය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම් හා පිටවීම් තහවුරු කිරීමකින් තොරව 2021 ජනවාරි 01 සිට ජූලි 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ නැගෙනහිර පළාත් සභාවේ විවිධ පළාත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ විසින් එකතුව රු. මිලියන 2,627.50 ක අතිකාල සහ නිවාඩු දින දීමනා ගෙවා තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී මෙවා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අතිකාල සහ නිවාඩු ගෙවීම් සිදු කිරීමට පෙර පැමිණීම් සහ පිටවීම් තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත කළ යුතුය. |
| (ආ) | 2011 සිට 2013 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි මල්වත්ත - සුරුප්පොඩෙයි මාර්ගයේ පාලම් 02ක් (0+360-2+920) ඉදිකිරීම සම්බන්ධයෙන් උද්ගත වූ ආරවුල් හේතුවෙන් රු. මිලියන 150 ක බේරුම්කරණ ගෙවීමක් පළාත් අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම ගෙවීම සිදු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් විමසා අනුමැතිය ලබාගෙන නොතිබූ අතර නැගෙනහිර පලාත් ප්‍රධාන ලේකම් විසින් මේ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. තවද, විගණනය වෙත ලැබී තිබුණු තොරතුරු අනුව කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 11 ක් ගෙවා මෙම ආරවුල් විසඳා ගැනීමට තිබූ අවස්ථාව අහිමි කර තිබීම හේතුවෙන් මෙලෙස රු. මිලියන 150 ක බේරුම්කරණ ගෙවීමක් සිදු කිරීමට සිදුවී තිබුණු බවද නිරීක්ශණය විය. මෙමගින් රජයට රු.මිලියන 139 ක පාඩුවක් සිදුවී තිබුණි. මේ සඳහා මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ලේකම් ඇමතු 2019 අප්‍රේල් 09 වන දිනැති අංක BD/GPS/321/02/02 ලිපිය මඟින් කරුණු | මුදල් ගෙවීමට පෙර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත මහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දී ඇති බව මෙයින් තහවුරු වේ.<br><br>විනිශ්චයකරු (Adjudicator) 2014 පෙබරවාරි 12 වැනි දින තම තීරණය ලබා දුන් අතර, එම තීරණය දැනුම් දෙන අවස්ථාවේ ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්නව පැවතුණි. තවද එම තීරණය කොන්ත්‍රාත්කරුට හිතකර තීරණයක් විය.<br><br>එබැවින්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් පත් කරන ලද එවකට අධීක්ෂණ උපදේශකවරුන්ගේ | විධිමත් පරීක්ෂණයක් පවත්වා මෙම ගනුදෙනුව තුළින් රජයට පාඩුවක් සිදු වී තිබුණේ නම් එය වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පෙන්වා දී තිබුණේ මෙම බේරුම්කරණ ගෙවීමේ වගකීම අදාළ නිළධාරීන් භාරගනු ලබන්නේ නම් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමෙන් පසු භාණ්ඩාගාරයේ පවත්නා මූල්‍ය තත්ත්වයද සැළකිල්ලට ගෙන මෙම ගෙවීම් සම්බන්ධව භාණ්ඩාගාරය සළකා බලනු ලබන බවය. කෙසේ වෙතත් ඉහත පරිදි කටයුතු නොකර මෙම ගෙවීම් සිදුකර තිබුණු බව තවදුරටත් නිරීක්ශණය විය.මීට අමතරව මෙම බේරුම්කරණ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා නීතිඥ ගාස්තු ලෙස, රු. මිලියන 6.6 ක්ද දරා තිබුණි. | නිර්දේශය ඇතිව නැගෙනහිර පළාත් සභාව බේරුම්කරණයක් ආරම්භ කරන ලදී.<br><br>1995 අංක 11 දරන බේරුම්කරණ පනතේ 6 වැනි වගන්තියට අනුව බේරුම්කරු තෝරා ගැනීම සිදු කරන ලදී.<br><br>ලෝක බැංකු ආධාර යටතේ මෙම මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින අතරතුර බේරුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, ලෝක බැංකු ණය කල් ඉකුත් වූ පසු ව්‍යාපෘති අරමුදලින් ගෙවීම් කරන ලදී. තවද පළාත් සභා අරමුදලෙන් නීතිඥයකුට ගෙවීම් කරන ලදී. | |
| (ඇ) | නැගෙනහිර පළාත් සභාව සඳහා සිව්මහල් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීම සඳහා නැගෙනහිර පළාතේ පළාත් ලේකම් කාර්යාලය, ශීර්ෂය යටතේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී රු. මිලියන **205.38** ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව රු. මිලියන **194.5** ක එකඟ වූ මුදලකට කොන්ත්‍රාත්කරුවෙකුට **2017** දෙසැම්බර් **18** දින පිරිනමා තිබූ අතර 2018 දෙසැම්බර් 04 හෝ එදිනට පෙර කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතු දින සිට 2021 ජූලි 31 දක්වා කාලය තුළ අවස්ථා 07 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණද, 2022 ඔක්තෝම්බර් 31 දින වන විටත් මෙම කර්මාන්තය අවසන් කර අපේක්ෂිත අරමුණු සඳහා යොදවා ගෙන නොතිබුණි. | කාර්යය ප්‍රදානය කරන ලද්දේ 2017 දෙසැම්බර් 04 වැනිදාය. නිම කිරීමේ කාලය වසරක් විය. මේ අනුව සම්පූර්ණ කළ යුතු දිනය 2018 දෙසැම්බර් 03 වැනි දින වේ. කෙසේ වෙතත් නොවැළැක්විය හැකි හේතූන් මත කොන්ත්‍රාත්කරුට මෙම වැඩ නිම කිරීමට නොහැකි විය.<br>කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු 2021.12.07 වන දින ගොඩනැගිල්ල භාර දී ඇත. කොන්ත්‍රාත් ගිවිසුමේ නොමැති කොටස් කිරීමේ කටයුතු | කොන්ත්‍රාත් කාලය තුළ ගොඩනැගිලි වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | (Partitioning works) සිදු කිරීමට නියමිතව තිබූ අතර එය වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී ඇති අතර එය අවසන් කර මේ වන විට ගොඩනැගිල්ල පදිංචියට සූදානම් කර ඇත. | |
| (ii) | මෙම ප්‍රමාද කිරීම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ආසන්න වශයෙන් රු. මිලියන 5 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් 2021 ජූලි, අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාසවල පැවති covid-19 වසංගතය හේතුවෙන් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇති අතර, ඉහත හේතුව සලකා බලා එය සේවායෝජකයා විසින් අනුමත කරන ලදී. පසුව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5 ශීර්ෂය - 921 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය- මූල්‍ය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන වෙනුවෙන් පළාත් සභාවේ ආදායම් ඒකකය විසින්, එකතු කර තිබූ උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු පිළිවෙලින් රු. මිලියන **274.74** ක් සහ රු. මිලියන **4.64**ක් අදාළ පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කළ බවට තහවුරු කරන විස්තර වාර්ෂික කාර්යසාධන වාර්තාවේ හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මේ වසරේ සිට පියවර ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පරිශීලකයාට අවබෝධ කර ගැනීම සඳහා ආදායම පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| **(ආ)** | **2008** අංක **01** දරන නැගෙනහිර පළාතේ **89 (1)** මූල්‍ය ප්‍රඥප්තිය ප්‍රකාරව**,** දේපළ විකිණීමේදී පැහැර හරින බදු මුදල් අයකිරීම් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වුවද **2014** ජනවාරි **01** සිට **2022** ජනවාරි **31** දක්වා කාලය තුළ අවස්ථා **380** ක දී එලෙස පැහැර හරින ලද රු. මිලියන **33.32**ක් පළාත් සභාවට අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2008 අංක 01 දරන මූල්‍ය ප්‍රඥප්තියට අනුව නැගෙනහිර පළාත් කොමසාරිස්වරයාට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පමණක් බලය ඇත. කෙසේ වෙතත්, 2020.11.05 දින කොමසාරිස්වරයා පත් කරන ලදී. දැන් ඔහු පැහැර හරින බදුවලට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් එකතු කර අදාල ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| **(ඇ)** | දෙපාර්තමේන්තු 05කට අදාළව වර්ෂ 02කට අධික කාලයක් ඉකුත්ව පැවති රු. මිලියන 11.30ක රැඳවුම් මුදල් සහ දෙපාර්තමේන්තු 12 කට අයත් එකතුව රු. මිලියන 18.75 ක විවිධ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම වසර තුළ මෙම මුදල් පියවීමට කටයුතු කරනු ලැබේ. | මෙම මුදල් ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභා ලේකම් කාර්යාලය**,** ප්‍රධාන ලේකම් කාර්යාලය**,** පළාත් භාණ්ඩාගාරය සහ නැගෙනහිර පළාත් සභාවේ දෙපාර්තමේන්තු **04**කට අදාළව වර්ෂ 05කට අධික කාලයක සිට පැවැත එන එකතුව රු. මිලියන **27.29** ක් වූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂ සම්බන්ධයෙන් **2004** ඔක්තෝබර් **11** දිනැති අංක **118** දරන ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | **අධ්‍යාපන දෙපාර්තමේන්තුව:** 2021 වර්ෂයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශයේ දක්වා තිබූ රු.15,501,613ක මුදල 2022 පළමු කාර්තුවේදී රු.904,108 ක් දක්වා අඩු කර ඇත.<br>**PDHS:** නොවිසඳුණු ණය ශේෂ අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව ඵලදායී පියවර කිහිපයක් ගෙන ඇත.<br><br>**සභා ලේකම් කාර්යාලය:** නිලධාරීන් දෙදෙනෙකු ඔවුන්ගේ ණය ශේෂය සම්පූර්ණයෙන් පියවා ඇති අතර එක් නිලධාරියෙකු රුපියල් 54,117.54 ක ණය ශේෂයෙන් රුපියල් 15,000.00 ක මුදලක් පියවා ඇත. අනෙකුත් නිලධාරීන් මෙතෙක් ඔවුන්ගේ ණය ශේෂය පියවා නොතිබුණි.<br><br>**ගොඩනැගිලි දපාර්තෙමන්තුව:** ණය ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේ**.**<br><br>**ප්‍රධාන ලේකම්:** ආපදා ණය ශේෂය වූ රු.143,926.00 න් රු.129,757.51 ක් අයකර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල දක්වා ඇති මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.6 ශීර්ෂය - 922 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - සැලසුම්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන, නිර්ණායක පාදක ප්‍රාග්ධන ප්‍රදාන ඇතුළුව විවිධ ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලියන 5,983ක් සමාලෝචිත වර්ෂයේදී පළාත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා වෙන් කර තිබුණු අතර එයින් රු. මිලියන 3,517ක් හෙවත් සියයට 58ක් පමණක් අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත මුදා හැර තිබුණි. ඉතිරි රු. මිලියන 2,466ක් හෙවත් සියයට 42ක් සමාලෝචිත වර්ෂය වන විටත් මුදා හැර නොතිබුණු අතර ඊට හේතු වී තිබුණේ | පිළිගනිමි. ඉදිරියේදී මෙම ඡේදයේ සඳහන් අඩුපාඩු නිවැරදි කිරීමට අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙත උපදෙස් ලබා දී ඇත. | නිශ්චිත කාර්යයන් සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට හෝ පෙර ක්‍රියාකාරකම් සැලැස්ම, ප්‍රසම්පාදන කාලසටහන් ඇතුළු ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රසම්පාදන කාල සටහන් ඇතුළු උපයමාර්ගික සැලසුම් නිසි පරිදි සකස් නොකිරීමයි. | | |
| (ආ) | පළාත් සභාවේ අමාත්‍යාංශ 05ක් සහ විවිධ ආයතන 09 ක් විසින් අංක 2014/01 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කර නොතිබුණි. | සටහන් කර ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් පරිදි ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

1.5.7 **ශීර්ෂය - 923 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - පරිපාලන**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය (පරිපාලන) යටතේ පවතින රජයේ නිල නිවාස **31**ක සහ අමුත්තන්ගේ නිවාස **02**ක වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන ඒමට කටයුතු කර නොතිබූ අතර මෙම ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා අදාළ හිමිකම් ඔප්පු සහ මිනින්දෝරු සැලසුම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පරිපාලනමය ගැටළුවන අතර ඉඩම් සම්බන්ධ සියලුම ලියකියවිලි සහ තක්සේරු කිරීම් සඳහා නිසි විසඳුමක් සෙවිය යුතුය. එබැවින් මෙම ගැටළු වෙනුවෙන් ඵලදායි විසඳුම් සෙවීම සඳහා සියලුම අමාත්‍යාංශ සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාමූහිකව කටයුතු කිරීමට අපට සැලසුමක් තිබේ. | රජයේ නිල නිවාස, අමුත්තන්ගේ නිවාසවල වටිනාකම් තක්සේරු කර ගිණුම් වෙත ගෙන ඒමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාවට අනුව**,** ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා **I** ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනුමත සේවක සංඛ්‍යාව 03 ක් පමණි. එසේ වුවද නැගෙනහිර පළාත් සභාව තුළ **I** ශ්‍රේණියේ නිලධාරීන් **13** දෙනෙකු සේවයේ යොදවා ගෙන ඇති අතර**,** ඔවුන්ගෙන් **10** දෙනෙකු **II** ශ්‍රේණියේ සහ **III** ශ්‍රේණියේ තනතුරුවල සේවය කරමින් තිබුණි. | අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ඉංජිනේරුවන්ට පළාත් සභාවේ I පන්තියේ තනතුරක් ලැබිය යුතුය. නමුත් I පන්තියේ ඉංජිනේරුවන් සඳහා තනතුරු තුනක් පමණක් පවතියි. එබැවින් අවම වශයෙන් I වැනි පන්තියේ තනතුරු අවම 6ක්වත් වැඩි කර දෙන ලෙස අපි විසින් ඉල්ලා ඇත. නමුත් එයට මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එම තනතුරු මෙතෙක් අනුමත කර නොමැත. | නැගෙනහිර පළාත් සභාවේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | විවිධ ශ්‍රේණිවලට අදාළ තනතුරු සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 19,418ක් වුවද, එයින් සියයට 30ක් හෙවත් සේවක පුරප්පාඩු 5,827ක් වසර 05 කට වැඩි කාලයක සිට පැවතුණි. එසේ තිබියදී නිළධාරීන් 2,607ක් විවිධ තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අතිරික්ත ලෙස බඳවාගෙන තිබුණි. | නැගෙනහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මානව සම්පත් වගකීම වන්නේ මෙම පළාතේ සියලුම ආයතනවල සේවක සංඛ්‍යා තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා පමණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව අවශ්‍ය පළාත වලට මාරු කිරීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.8 ශීර්ෂය - 924 - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - ඉංජිනේරු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය (ඉංජිනේරු සේවා සහ යටිතල පහසුකම්) විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාගේ ලියාපදිංචිය අවලංගු කිරීමකින් තොරව වාහන **17** ක් රු. මිලියන **5.84** ක සුන්බුන් වටිනාකමකට වෙන්දේසි කර තිබුණි. | අනාගතයේදී මෙවැනි වරදක් සිදු නොවනු ඇත. | වාහන වෙන්දේසි කිරීමට පෙර එම වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නැගෙනහිර පළාත් ඉංජිනේරු සේවා හා යටිතල පහසුකම් ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) තනතුර සඳහා පෙර සේවයේ නියුතු නිළධාරියාම කොන්ත්‍රාත් පදනම මත 2021 අප්‍රේල් සිට නොවැම්බර් දක්වා නැවත සේවයේ යොදවා ගෙන තිබුණි. මෙම පත්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණ අතර කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ නියුතු වී සිටි කාලය තුළ රු. මිලියන 1.34ක් වැටුප් හා දීමනා වශයෙන් ඔහු වෙත ගෙවා තිබුණි. | 2021 අප්‍රේල් 01 සිට නොවැම්බර් 30 දක්වා නැවත සේවයට බඳවා ගැනීම ගරු ආණ්ඩුකාරවරයා විසින් මාසික පදනමින් අනුමත කරන ලදී. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | අළුත්වැඩියා කිරීම ලාභදායී ලෙස හඳුනාගෙන ඇති වාහන 284 ක් එළෙස අලුත්වැඩියා කර ධාවනයේ යෙදීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කරන ලද තාක්ෂණික වාර්තාව යටතේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් තම වාහන අලුත්වැඩියා කිරීමට පියවර ගත යුතුය. මුදල් නොමැතිකම සහ වාහන අමතර කොටස් රට තුළ නොමැතිකම හේතුවෙන් ඇතැම් අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වී ඇති බව අපි හඳුනා ගන්නා ලදී. | මෙම වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.9 ශීර්ෂය - 926 - පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ අමාත්‍යාංශ සහ විවිධ දෙපාර්තමේන්තු සඳහා අභ්‍යන්තර විගණකවරුන් පත් කර තිබුණද, අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කළ බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කර ඇත. ඉදිරියේදී මෙවැනි අතපසුවීම් අවම කිරීමට කටයුතු කරනු ලැබේ. | අභ්‍යන්තර විගණන ඒකක මගින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කළ යුතුය. |

### 1.5.10 ශීර්ෂය - 927 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර පළාත නමින් ලියාපදිංචි වී ඇති වාහන **112,068**ක් වෙනුවෙන් වර්ෂ **10**කට අධික කාලයක සිට ආදායම් බලපත්‍ර අළුත් වැඩියා කර නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් පළාත් මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් අදාළ වාහනවල හිමිකරුවන්ට විරුද්ධව පියවර ගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර භාවිතා නොකරන වාහන සම්බන්ධයෙන් මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (RMV) අඛණ්ඩව ක්‍රියාමාර්ග ගත යුතුය. | වාහන ආදායම් බලපත්‍රය අලුත් කිරීමකින් තොරව භාවිත කරන වාහනවල හිමිකරුවන්ට විරුද්ධව පියවර ගත යුතුය. |
| (ආ) | 2015 වසරේ නැගෙනහිර පළාත තුළ ඊ-ආදායම් බලපත්‍ර ක්‍රමය හඳුන්වාදීම සඳහා පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් රුපියල් මිලියන 6.43ක මුදලක් වැය කර තිබුණද, ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් නොමැතිකම හේතුවෙන් මෙම පළාතේ ලියාපදිංචි මුළු වාහනවලින් සියයට 99ක් වූ හෙවත් වාහන 409,603ක් මෙම මාර්ගගත ක්‍රමය භාවිත කර නොතිබුණි. | තමන් විසින්ම බලපත්‍රයට අයදුම් කිරීමට මහජනතාව දැනුවත් කිරීම සඳහා වන මාර්ගෝපදේශන, පොත් පත් සහ පත්‍රිකා ආකාරයෙන් සකස් කරන ලදී. එසේම, මෙම මාර්ගෝපදේශ මහජනතාව වෙත ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත තබා ඇත. | මෙම මාර්ගගත ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 1.5.11 ශීර්ෂය - 931 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ "තිරිසර කෘෂි සංස්කෘතිය" යන කාබනික කෘෂිකාර්මික වැඩසටහන යටතේ පරිසර හිතකාමී ලෙස ආරක්ෂිත කෘෂිකාර්මික ඒකක පිහිටුවීම සඳහා සහ කෘෂිකර්ම නිෂ්පාදන පරීක්ෂණ රසායනාගාරයක් පිහිටුවීම සඳහා පිළිවෙලින් රු. මිලියන **25** ක් සහ රු.මිලියන 200 ක් වෙන් කර තිබුණි. එසේ උවද මෙම කාර්යය ආරම්භ කර නොතිබූ අතර අග්‍රිම මුදල් අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට නොගෙන පළාත් භාණ්ඩාගාරයට නැවත ප්‍රේෂණය කර තිබුණි. තවද ඉහත වැඩසටහන යටතේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු. මිලියන 260.2 ක අග්‍රිමයක් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ නියමිත ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 51.2 ක් හෙවත් සියයට 20 ක් පමණක් වැය කර තිබුණි. | ආරක්ෂිත කෘෂිකාර්මික ඒකකයක් පිහිටුවීම සඳහා ගැල්වනයිස් කරන ලද පයිප්ප, සෙවන දැල් සහ ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතියක් සහිත UV පිරියම් කරන ලද පොලිතීන් අවශ්‍ය වේ. ගරු ආණ්ඩුකාරවරයා සමඟ පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී Covid 19 වසංගත තත්ත්වය සහ මිල උච්චාවචනය හේතුවෙන් අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට ඇති දුෂ්කරතා පිළිබඳව සාකච්ඡා කෙරිණි. පසුව මෙම වැඩසටහන අත්හැර දමා එම අරමුදල භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට තීරණය කරන ලදී. | අපේක්ෂිත කාර්යය ඉටු කිරීම සඳහා මුදල් වර්ෂය තුළ ප්‍රතිපාදන යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගුරුවරුන්ට, සිසුන්ට සහ රජයේ නිලධාරීන්ට තම නිවෙස්වල ගෙවතු වගාව හා විෂ රහිත ආහාර පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම උදෙසා ආදර්ශයක් ලෙස පාසල්වල සහ රජයේ ආයතනවල කාබනික උද්‍යාන **126**ක් ස්ථාපිත කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත **2017, 2018** සහ **2020** වර්ෂවල රු.මිලියන **9.88** ක මුදලක් වෙන් කර දී තිබුණි. කෙසේ වෙතත්, උනන්දුවක් දක්වන පාර්ශවයන් සම්බන්ධ නොවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. මේ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා ආදර්ශ ආයතන **60**ක් සඳහා වැය කර තිබූ රුපියල් මිලියන **1.7** ක වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි. | සමහර පාසල් ආදර්ශ උද්‍යාන නඩත්තු කිරීමට අසමත් විය. කෘෂිකර්ම උපදේශකවරුන්ට සහ තාක්ෂණික සහකාරවරුන්ට ඔවුන්ගේ ක්ෂේත්‍ර චාරිකාවේදී පූර්ව වැඩසටහනට ඇතුළත් කර පාසල්වල ආදර්ශ උද්‍යාන අධීක්ෂණය කිරීමට උපදෙස් දෙන ලදී.<br><br>උද්‍යාන අඛණ්ඩව නඩත්තු කිරීම වෙනුවෙන් උපකරණ භාවිතා කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සහ තාක්ෂණික මාර්ගෝපදේශ ලබා දෙන ලදී. | මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් යන්ත්‍රෝපකරණ 09 ක් රු.999,649 ක පිරිවැයට මිලදී ගෙන කරදියනාරු සේවාස්ථ පුහුණු ආයතනයේ බිම්මල් ව්‍යාපෘතිය සඳහා 2019 අප්‍රේල් මස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත භාර දී | බිම්මල් ඒකකය නිසි ලෙස ක්‍රියාත්මක නොවිය.<br>මේ සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කරන ලෙස නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත උපදෙස් දෙන ලදී. | මෙම යන්ත්‍ර සූත්‍ර අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණද, ඉහත යන්ත්‍ර උපකරණ අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර වසර 03 ට වඩා කාලයක් නිශ්ක්‍රීයව පැවතුනි. | | |
| (ඇ) | සාම්ප්‍රදායික ආහාර ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සහ උපකරණ සැපයීම සඳහා රුපියල් මිලියන 7.2ක් වැය කර තිබුණි. 2020 ඔක්තෝබර් 12 වන දින එය නිමකර භාර දී තිබුණද, එම ගොඩනැගිල්ල සහ මිලදී ගත් උපකරණ එම අරමුණු සඳහා භාවිතා කර නොතිබූ අතර 2022 නොවැම්බර් 30 දක්වා අක්‍රීයව පැවතුනි. | "හෙළ බොජුන්" විවෘත කිරීම සඳහා 2020.09.07 දින උපකරණ මිලදී ගෙන ඇතත් අනපේක්ෂිත කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එය සාමාන්‍ය තත්ත්වයට පත් වන තෙක් ප්‍රමාද විය. කෙසේ වෙතත්, එය ක්‍රියාත්මක වන විට, මිශ්‍ර බ්ලෙන්ඩරය, තෙත් ඇඹරුම් යන්ත්‍රය සහ ගෑස් කුකර් (කුඩා) සඳහා වන වගකීම් කාලය අවසන් වී තිබුණි. මේ තත්ත්වය අපේ පාලනයෙන් තොරය. | සාම්ප්‍රදායික ආහාර ප්‍රවර්ධන මධ්‍යස්ථානය සඳහා මිලදී ගත් ගොඩනැගිල්ල සහ උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය - 932 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු නොකර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් ගබඩාවල වාහන 35ක් වසරකට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම වාහන නැගෙනහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වෙත භාරදීමට කටයුතු කරමින් සිටී. | මෙම වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුයි. |

**1.5.13 ශීර්ෂය - 934 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි පරිශ්‍රයේ අම්පාර ආණ්ඩුකාර ලේකම් කාර්යාලය සඳහා උප කාර්යාලයක් පිහිටුවීම වෙනුවෙන් 2021 වසරේදී රුපියල් මිලියන 1.2 ක වියදමක් දරා තිබුණි. එසේ වුවද මෙම පරිශ්‍රය අදාළ අරමුණු සඳහා යොදවා නොගෙන වසරකට අධික කාලයක් කිසිදු ගාස්තුවක් අය කිරීමකින් තොරව නවාතැන් පහසුකම් සඳහා නිලධාරීන්ට ලබා දී තිබුණි. | මෙම ගොඩනැගිල්ල උප කාර්යාලයක් පවත්වා ගැනීමේ අරමුණින් ඉටු කරන ලදී. | ප්‍රයෝජනයට ගැනීමටත්, හිඟ කුලී අයකර ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

## 1.5.14 ශීර්ෂය - 941 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | COVID – 19 වසංගත තත්ත්වය හේතුවෙන් පාසල් වසා තිබියදීත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දුෂ්කර හා අති දුෂ්කර ප්‍රදේශවල පවතින පාසල් 179 ක සේවයේ නිරතවී සිටින ගුරුවරුන් සඳහා 2021 මැයි, ජුනි, ජුලි සහ සැප්තැම්බර් මාස වෙනුවෙන් එකතුව රු. මිලියන 18.44 ක දුෂ්කර දීමනාවක් ගෙවා තිබුණි. | එම කාලය තුළ ඇතැම් ගුරුවරුන් හෝ විදුහල්පතිවරුන් එම දුෂ්කර/ ඉතා දුෂ්කර ප්‍රදේශවල සේවයේ නිරතවී සිටියාද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය.<br>මේ සම්බන්ධයෙන් මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා අපට උපදෙස් ලබා දෙන්නේ නම් එම ගෙවීම අපට ආපසු අයකර ගත හැකියි. | කොවිඩ්-19 කාලසීමාව තුළ අධ්‍යයන කාර්ය මණ්ඩල යෙදවීම තහවුරු නොකර ගෙවා ඇති දීමනා අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නැඟෙනහිර පළාතේ පාසල් 1,117ක, කලාප අධ්‍යාපන කාර්යාල 17ක සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉන්වෙන්ටරි අයිතමවල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය වසර 02කට වඩා වැඩි කාලයක් පුරා සිදු කර නොතිබූ අතර, ඒ හේතුවෙන් මෙම දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ පද්ධතිය මේ දක්වා යාවත්කාලීන කර නොමැති බවද නිරීක්ෂණය විය. | අදාල භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | නියමිත කාලය තුළ සියලුම පාසල්වල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | ත්‍රි/කින්/වාන් ඇල්ල මුස්ලිම් විද්‍යාලයට ඉංග්‍රීසි ගුරුවරයෙකු පත් කර තිබූ නමුත් එම ගුරුවරයා 2018 දෙසැම්බර් 26 සිට රාජකාරි සඳහා පාසලට වාර්තා කර නොතිබියදීත් එදින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රුපියල් මිලියන 1.57ක පුද්ගල පඩිනඩි ලෙස ගෙවා ඔහු වෙත ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | එසේ ගෙවූ මුදල් වගකිවයුතු නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ටී/ටීඑන්/ගෝමරන්කඩවල මහා විද්‍යාලයට පත් කර තිබූ ගණිත ගුරුවරයා 2008 දෙසැම්බර් 31 සිට 2021 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ පාසලේ සේවයට වාර්තා කර නොතිබීයදීත් රුපියල් මිලියන 5.59ක පුද්ගල පඩිනඩි ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | එසේ ගෙවූ මුදල් වගකිවයුතු නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කින්නියා අධ්‍යාපන කලාපයේ පාසල් 66 ක සිසුන් සඳහා විවිධ විෂයයන් ඉගැන්වීම වෙනුවෙන් රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද සංවර්ධන නිලධාරීන් 248 දෙනෙකු උපාධිධාරී අභ්‍යාසලාභී ගුරුවරුන් ලෙස යොදවා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් මිලියන 59.52ක් ඔවුන් | අදහස් දක්වා නොමැත. | එම සංවර්ධන නිලධාරින්ට ගුරු පත්වීම් ලිපිය නිසි පරිදි ලබාදීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | වෙත දීමනා ලෙස ගෙවා තිබුණි. මේ අනුව ගුරු පත්වීම් ලිපියක් හෝ නිකුත් කිරීමකින් තොරව 2022 ජූලි 31 දින දක්වාම සංවර්ධන නිලධාරීන්ට ඉගැන්වීමට අවසර දී ඇති බව නිරීක්ෂණය වේ. | | |
| (ඊ) | ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයත් විදුහල්පතිවරුන් බඳවා ගැනීමට කටයුතු නොකර විවිධ පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස 360 දෙනෙකු වසර 06ට වඩා වැඩි කාලයක් සේවයේ යොදවා ගෙන තිබුණි. එය සමස්ත අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 25 කි. | අදහස් දක්වා නොමැත. | ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අනුයුක්ත විදුහල්පතිවරුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (උ) | නැගෙනහිර පළාත් කලාප අධ්‍යාපන කාර්යාල 15ක විදුහල්පතිවරුන්ගේ පුරප්පාඩු 566ක් පැවතියදීත් අම්පාර දිස්ත්‍රික්කයේ කලාප අධ්‍යාපන කාර්යාල 02 ක විදුහල්පතිවරුන් 20ක් අතිරික්තව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | පළාත තුල පවතින අතිරික්තය සහ ඌණතා සමතුලිත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඌ) | නැගෙනහිර පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 17ක් පවතින අතර එයින් කලාප අධ්‍යාපන කාර්යාල 11ක ගුරුවරුන් 1,509ක් පුරප්පාඩු වී තිබියදීත් නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනෙකුත් කලාප අධ්‍යාපන කාර්යාල 06 ක් සඳහා ගුරුවරුන් 664ක් අතිරික්තව පත් කර තිබුණි. මේ අනුව කින්නියා අධ්‍යාපන කලාපයේ පාසල්වල විෂයයන් 18ක් සඳහා ගුරුවරුන් 100ක අතිරික්තයක් පැවතුණි. | පිළිතුරු සපයා නොමැත. | පළාත තුළ පවතින ගුරු අතිරික්තය හා ඌණතා සමතුලිත කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.15 **ශීර්ෂය - 950 - සෞඛ්‍ය අමාත්‍යාංශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| නැගෙනහිර පළාත් සභාවේ විවිධ රෝහල් සඳහා වෛද්‍ය උපදේශකවරුන් **40ක්,** වෛද්‍ය නිලධාරීන් **138**ක් සහ හෙද නිලධාරීන් **323**ක් පත් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රෝගී සත්කාර සේවාවවන් බාධාවකින් තොරව කර ගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගත වී තිබුණි. | වෛද්‍ය උපදේශක, වෛද්‍ය නිලධාරීන් සහ හෙද නිලධාරීන් පත්කිරීම රේඛීය අමාත්‍යාංශය මගින් කරනු ලැබේ. | වෛද්‍ය උපදේශක, වෛද්‍ය නිලධාරී, හෙද නිලධාරීන්ගේ පුරප්පාඩු නොපමාව පිරවීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.16 ශීර්ෂය - 951 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 8,081.24 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වූවද, රු. මිලියන 8,002.08 ක වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබූ අතර තවත් රු. මිලියන 272.10ක බැරකම් සඳහාද බැඳීම් ඇති කර ගෙන තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 192.94ක බැඳීමකට එළැඹ තිබුණි. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා පුනරාවර්තන අයවැය ලෙස රුපියල් මිලියන 10,088.92 සඳහා කෙටුම්පත් ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. නමුත් අනුමත අයවැය ප්‍රතිපාදන ලෙස රු.මිලියන 6,927.04ක් පමණක් වෙන් කර තිබුණු අතර රු.මිලියන 1,154.20 ක පරිපූරක ප්‍රතිපාදන සහිතව 2021 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 8,081.24 පමණක් වෙන් කර තිබුණි. | අයවැය ඇස්තමේන්තුව තුළ වියදම් සීමා කිරීමට හෝ අයවැය සංශෝධනය කිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 වසරේදී සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ අංක 01-18/2019 දරන චක්‍රලේඛයට අනුව ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PSSP) සඳහා ලියාපදිංචි වූ සෑම පුද්ගලයෙකුටම පුද්ගලික සෞඛ්‍ය වාර්තාවක් (PHR) නිකුත් කළ යුතුව තිබුණත් නැගෙනහිර පළාතේ රෝහල් 05 කින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඇතැම් රෝහල් මෙම PHR නිකුත් කිරීමට මැළිකමක් දක්වන අතර, නිරන්තර අධීක්ෂණය සහ මගපෙන්වීම මගින් මෙම තත්ත්වය වැඩිදියුණු කර ඇත. කෙසේ වෙතත්, ලෝක බැංකුවට අනුව, අනෙකුත් පළාත්වලට සාපේක්ෂව PHR නිකුත් කිරීමේ සහ අනෙකුත් ව්‍යාපෘති ක්ෂේත්‍රයන්හි හොඳම ව්‍යාපෘති කාර්යාලය නැගෙනහිර පළාත වේ. | ඉතිරි රෝහල් 05 ක පුද්ගලික සෞඛ්‍ය වාර්තා (PHR) සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.17 ශීර්ෂය - 952 - දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 7ක්වූ සේරුවිල මධ්‍යම ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඉදිකිරීම් කටයුතු 2021 දෙසැම්බර් 01 දින නිම කළයුතු වූවත් 2022 මැයි 31 දක්වා අත්තිවාරම් කටයුතු පමණක් නිම කර තිබූ අතර පසු විපරම් ක්‍රියාමාර්ගයද දුර්වල මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය. | සේරුවිල මධ්‍යම ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින් නියමිත කාලසීමාව තුළ අවසන් නොකරන ලදී. තවද කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් සඳහා කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා සිටියේද නැත. | කොන්ත්‍රාත් කාලය තුළ ගොඩනැගිලි කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.18 ශීර්ෂය - 962 - ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | |
|---|---|---|
| පසුගිය වර්ෂ **05**කට අධික කාලයක සිට නැගෙනහිර පළාත තුළ පුද්ගලයන් **5,155**ක් නීත්‍යානුකූල ඉඩම් අයිතියක් නොමැතිව රජයේ ඉඩමවල පදිංචි වී සිටින අතර සමාලෝචිත වර්ෂය තුළ එම අනවසර පදිංචිකරුවන් **1,988** දෙනෙකු වෙත ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් ඉඩම් අත්කර ගැනීමේ නිවේදන නිකුත් කර තිබුණි. මේ හේතුවෙන්, **2022** ජූනි **30** දින දක්වා පුද්ගලයින් **1,509**ක් විසින් අධිකරණයේ ගොනු කර තිබූ නඩු නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් අවසන් වී නොතිබුණි. | ඉඩම් සංවර්ධන ආඥා පනතේ අංක 179 සහ 180 දරන නියෝගයන් අනුව මෙම කටයුතු සඳහා වගකිව යුතු නිලධාරීන් වනුයේ ප්‍රාදේශීය ලේකම්, ජනපද නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීවරුන් බව නිශ්චිතවම සඳහන් කර තිබේ. | පවතින නඩු කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.5.19 ප්‍රඥප්ති ගිණුම්

#### (අ) නිවාස අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | පසුගිය වර්ෂයේ අවසාන ශුද්ධ වත්කම් ශේෂය රු. මිලියන **5.03**ක් වූ අතර එය සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ ආරම්භක ශේෂය රු. මිලියන **8.33**ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන්, ශුද්ධ වත්කම්වල රු. මිලියන **3.3** ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ශණය විය. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් වැඩියෙන් දක්වා තිබුණි. ඉදිරි වසරවලදී මෙවැනි අතපසුවීම් සිදු නොවන බවටත්, ඉදිරි මූල්‍ය ප්‍රකාශයෙන් මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බවටත් අපි සහතික වෙමු. | මූල්‍ය ප්‍රකාශන වලට නිවැරදි මුදල ගෙන යා යුතුය. |
| **(ii)** | දිස්ත්‍රික්ක **03**ක ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවිය යුතුව තිබූ රු. මිලියන **3.72**ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම බැරකම් යටතේ දක්වා නොතිබුණි. | ඉදිරි වසරේ අවසන් ගිණුම සකස් කිරීමේදී මෙම දෝෂ නිවැරදි කරනු ලැබේ | අතැති බිල්පත් මූල්‍ය ප්‍රකාශනවල වගකීම් ලෙස හඳුනාගත යුතුය |
| **(iii)** | අධිකාරිය විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයන් 38 දෙනෙකු වෙනුවෙන් 2018 සැප්තැම්බර් 01 සිට 2021 මැයි 31 දක්වා කාලය සඳහා ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක | වසර 7ක් පුරා ගෙවිය යුතු දායක මුදල් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ත්‍රිකුණාමලයේ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු මුදල දැනුම් දුන් පසු ගෙවිය යුතු මුදල | කම්කරු නීති රීති පිළිපැදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාරකාර අරමුදල් දායකත්වය ගෙවා නොතිබීම හේතුවෙන් රු. මිලියන 4.64ක අධිභාරයක් පනවා තිබුණි. තවද, ඉහත දායක මුදල් හා අධිභාරය අදාළ අරමුදල් වෙත ප්‍රේෂණය කිරීමට අධිකාරිය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, EPF සහ ETF සඳහා දායක මුදල් 2021 ජුනි මාසයේ සිට ගෙවමින් පවතී. | |
| **(iv)** | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අධිකාරියට අවශ්‍ය කාර්ය මණ්ඩලයක් අනුමත කරවා ගෙන නොතිබුණු අතර, ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාවකින් තොරව නිලධාරීන් 38 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා වේතන ලෙස රු. මිලියන 14.77 ක් සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණි. | නව සේවක සංඛ්‍යාව අනුමැතිය සඳහා නැවත ඉදිරිපත් කිරීමට 2022.02.22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. | කාර්යමණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**(ආ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | දිස්ත්‍රික්ක **03**ක ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවිය යුතුව තිබූ රු. මිලියන **1.40** ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම බැරකම් යටතේ දක්වා නොතිබුණි. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) අරමුදල යටතේ පවතින ඉදිකිරීම් කටයුතු වලට අදාලව අතැති බිල්පත් 2021 වර්ෂයේ ජංගම වගකීම් ලෙස සඳහන් කර නොතිබුණි. ඉදිරියේ දී අතැති බිල්පත් වගකීම් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 වන විට පවතින වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| **(ii)** | නැඟෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් පෞද්ගලික බස් රථ බස් පර්යන්ත වෙත පැමිණීම සහ පිටවීම සටහන් කරගැනීම සඳහා **2015** ජුනි **08** දින රු. මිලියන **1.14** ක් වැය කර **GPRS** පද්ධතියට සම්බන්ධ **Point of Sale (POS) 13** ක් සහ ප්‍රවේශ පත්‍ර **2,000** ක් මිලදීගෙන තිබූ අතර, එම භාණ්ඩ අපේක්ෂිත අරමුණු සඳහා භාවිත නොකර වර්ෂ **06** කට අධික කාලයක් ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවැතුණි. | දැනට පද්ධතිය අත්හදා බැලීමේ කාලයක් යටතේ පවතී. අත්හදා බැලීමේ කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව, මෘදුකාංගය නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නම්, මෙම POS යන්ත්‍ර 13 දිස්ත්‍රික් තුනේම ක්‍රියාත්මක කළ හැකිය. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| **(iii)** | අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ද්විතියික මට්ටමේ නිලධාරීන් **06** දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් **35** දෙනෙකු බඳවා ගෙන තිබූ අතර එම නිලධාරීන්ට රු. මිලියන **9.06**ක් සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගල පාරිශ්‍රමික ලෙස ගෙවා තිබුණි. | නැඟෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගමනාගමන සේවාවන් වැඩිවීම නිසා කාර්ය මණ්ඩල අවශ්‍යතාද වැඩි වී තිබෙන අතර හිටපු ප්‍රධාන අමාත්‍යාංශ අමාත්‍යවරයාගේ සහ නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ නිර්දේශ මත මෙම තනතුරු සඳහා බඳවා ගන්නා ලදී. | අනුමත සේවක සංඛ්‍යා සඳහා පමණක් සේවයේ යෙදවීමට සහ සේවක වැටුප් ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ වේතන ගෙවීම එම අධිකාරිය විසින් ජනිත කරන මුදලින් සිදුකළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර වර්ෂ **05**කට අධික කාලයක් තිස්සේ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් එම වියදම් දරා තිබුණි. | අධිකාරිය මාසිකව රු.මිලියන 1.5 ක පමණ ආදායමක් උපයා ඇති අතර, මෙය පුනරාවර්තන වියදම්වලින් අඩක් පමණි. | ප්‍රවාහන අධිකාරිය විසින් එදිනෙදා වියදම් පියවා ගැනීම ප්‍රමාණවත් මුදලක් උපයා ගත යුතුය. |

**(ඇ)** **සංචාරක කාර්යාංශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කාර්යාංශය සඳහා සුදුසු සේවක සංඛ්‍යාවක් අනුමත කිරීමකින් තොරව **2019** අගෝස්තු **01** සිට **2021** දෙසැම්බර් **31** දක්වා වූ කාලය තුළ කොන්ත්‍රාත් පදනමකින් සියළු මට්ටම්වලට අදාළ සේවකයන් බඳවා ගෙන ඔවුන් වෙත රු. මිලියන **12** ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | නැඟෙනහිර පළාත් සංචාරක කාර්යාංශයේ සේවක මණ්ඩලයක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. | කාර්යමණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුයි. |

**(ඈ)** **පෙරපාසල් අධ්‍යාපන කාර්යාංශය**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම, පෙර පාසල් අධ්‍යාපන උපදේශක කමිටු පිහිටුවීම, පෙර පාසල් සංඛ්‍යාව, ගුරුවරුන් සහ දරුවන් පිළිබඳ සමීක්ෂණය, ආදායම් මූලාශ්‍ර ජනනය කිරීම, විෂය නිර්දේශ සහ විෂයපථය ස්ථාපිත කිරීම, පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම යනාදිය සඳහා ක්‍රියා පටිපාටි සහ රීති සැකසීමේ කාර්යයන් පසුගිය වර්ෂ 05කට අධික කාලයක් තුළ සිදුකර නොතිබුණි. තවද, පෙර පාසල් ගුරුවරුන්ගේ කාර්යසාධන ඇගයීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පුද්ගල පාරිශ්‍රමික ලෙස රු.මිලියන **132.84**ක් ගෙවා තිබුණි. | නුදුරු අනාගතයේ දී ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් සකස් කිරීමට පියවර ගන්නා අතර, මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරන ලෙස ක්ෂේත්‍ර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | පෙර පාසල් ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීමට හා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුයි. |